ශ්‍රී ලංකා වරාය අධිකාරිය.

මගේ අංකය : මාසකෝ/කාතානෝ/පුරප්පාඩු/2026

දැන්වීමයි.

පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති මෙම අධිකාරියේ ස්ථිර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

01. ප්‍රධාන රියදුරු (මෝටර් ලෝන්ච්) – Head Driver (Motor Launch) - (පුරප්පාඩු - කොළඹ - 01)

සේවා ගණය - කාක්ෂණ (T)

වැටුප් කාණ්ඩය : 7 : 3 (T : 3) ආරම්භක වැටුප : රු. 46665/=
වාර්ෂික වේතනාධිකය : රු. 1005 /=

දැනටමත් ඉහළ වැටුප් කාණ්ඩයක සිහිටුවා ඇති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට සිටින වැටුප් කාණ්ඩය සැලකිල්ලට ගෙන 7 : 1 (T : 1) හෝ 7 : 2 (T : 2) කාණ්ඩයේ සිහිටුවීම සලකා බලනු ලැබේ.

සුදුසුකම් :

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

සහ

1907 ලෝන්ච් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අශ්වබල 1000 (750KW) ට නොඅඩු ධාරිතාවයකින් යුක්ත සහතිකය

සමඟ

පළපුරුද්ද
මෝටර් ලෝන්ච් රියදුරු තනතුරේ වසර තුන (03) ක සක්‍රීය පළපුරුද්ද

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම

සහ

1907 ලෝන්ච් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අශ්වබල 1000 (750KW) ට නොඅඩු ධාරිතාවයකින් යුක්ත සහතිකය

සමඟ

පළපුරුද්ද
මෝටර් ලෝන්ච් රියදුරු තනතුරේ වසර පහ (05) ක සක්‍රීය පළපුරුද්ද

02 වන පිටුවට

02. ප්‍රධාන සරංගු - Head Serang - (පුරප්පාඩු - කොළඹ - 01)

සේවා ගණය - තාක්ෂණ (T)

වැටුප් කාණ්ඩය : 7 : 3 (T : 3) ආරම්භක වැටුප : රු. 46665/=
වාර්ෂික වේතනාධිකය : රු. 1005 /=

දැනටමත් ඉහළ වැටුප් කාණ්ඩයක පිහිටුවා ඇති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා කෝරා ගනු ලැබුවහොත් දැනට සිටින වැටුප් කාණ්ඩය සැලකිල්ලට ගෙන 7 : 1 (T : 1) හෝ 7 : 2 (T : 2) කාණ්ඩයේ පිහිටුවීම සලකා බලනු ලැබේ.

සුදුසුකම් :

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

සහ

1907 ලෝන්ච් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන කොක්ෂන් ප්‍රවීණතා සහතිකය

සමඟ

පළපුරුද්ද
සරංගු තනතුරේ වසර තුන (03) ක සක්‍රීය පළපුරුද්ද

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනාකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම

සහ

1907 ලෝන්ච් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන කොක්ෂන් ප්‍රවීණතා සහතිකය

සමඟ

පළපුරුද්ද
සරංගු තනතුරේ වසර පහ (05) ක සක්‍රීය පළපුරුද්ද

03 වන පිටුවට

වෙනත් - සියළුම තනතුරු වලට අදාළ වේ.

i. පසුගිය ආඥාන වසර තුන (03) ක කාර්ය සාධනය සතුටුදායක විය යුතුය.

ii. අ.පොස. (සා.පෙළ) විභාගය අසමත් අයදුම්කරුවන් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මඟින් පවත්වනු ලබන වරාය කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව හදාරා තිබිය යුතුය.

iii. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ වෘත්තීය පළපුරුද්ද පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් (සම්මුඛ හා ප්‍රායෝගික) සමත් විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

v. ආරක්ෂක නියාමක තනතුරට බඳවා ගෙන ඇති සේවකයින් මෙම තනතුරු වලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ආරක්ෂක සේවයේ වයර පහ (05) කට වැඩි සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නා ක්‍රියා කළ යුතුය.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යවන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ වරායක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක / අංශයක සේවය කිරීමට බැඳිසිටී.

රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමෙහිලා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීති රීතිවලට අනුකූලව පත්වීම් ලබන්නා ක්‍රියා කළ යුතු වේ.

මෙම නිවේදනය අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත් මාසකෝ/ආකෘති/01/2026 දරණ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කොට අදාළ කොට්ඨාශ / අංශ ප්‍රධානීන් මඟින් **2026.11. 30** වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. **අයදුම්පත සමඟ තනතුරට අදාළ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ/අංශ ප්‍රධානීන් හෝ නේවාසික කළමනාකරු විසින් හෝ සඳහන් කළ යුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (මාසකෝ/ආකෘති/01/2026 අයදුම්පත අදාළ කොට්ඨාශවලින් හා මානව සම්පත් කොට්ඨාශයේ සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගත හැක.)

මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කේ. කුමාරි සිරිවර්ධනගේ
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)
මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය
ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

2026.11. ०९ වන දින
මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය.